## රාජ්‍ය සේවා කොමිෂන් සභාව

## ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ පර්යේෂණ සහකාර තනතුරේ විශේෂ ශ්‍රේණියට සේවා පළපුරුද්ද හා කුසලතාවය මත උසස් කිරීම

උක්ත උසස් කිරීමට අදාළව 2019.01.11 දිනැතිව මා විසින් සිදුකල අයදුම්පත් කැඳවීමේ නිවේදනය හා බැඳේ. එකී අයදුම්පත් කැඳවීම මඟින් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ පර්යේෂණ සහකාර තනතුරේ විශේෂ ශ්‍රේණියේ 2017.05.02 දිනට පැවති පුරප්පාඩු 13 න් පුරප්පාඩු 09 ක් සේවා පළපුරුද්ද හා කුසලතාවය මත පිරවීමට අයදුම්පත් කැඳවා ඇත.

2015 හා 2016 වර්ෂවලට අදාළ විභාග ප්‍රතිඵල මත වෙන් කර ඇති පුරප්පාඩු පිරවීම සඳහා විභාග සමත් කිසිදු නිලධාරියෙකු නොමැති බැවින් එම පුරප්පාඩු දෙක ද සේවා පළපුරුද්ද හා කුසලතාවය මත පිරවීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ගේ PSC/APP/7/1181/2017 අංක හා 2019.05.24 දිනැති ලිපියෙන් අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව පහත සඳහන් පුරප්පාඩු දෙක ද සේවා පළපුරුද්ද හා කුසලතාවය මත පිරවීමට කටයුතු කරනු ලැබේ.

| වර්ෂය | පුරප්පාඩු දිනය |
|---|---|
| 2015 | 2015.09.26 |
| 2016 | 2016.08.08 |

ඒ අනුව උක්ත පුරප්පාඩු දිනයන්ට 2019.01.11 දිනැතිව නිකුත් කරන ලද අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ ඡේද අංක 1 යටතේ සඳහන් සුදුසුකම් සපුරා ඇති දැනට සේවයේ සිටින හෝ විශ්‍රාමික නිලධාරීන් පෙර නිවේදනයේ දක්වා තිබූ ආදර්ශ අයදුම්පත්‍රය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් අදාළ ඒකක ප්‍රධානී මඟින් 2019.06.21 දිනට පෙර කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්, පාලන 01 ශාඛාව, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පේරාදෙණිය වෙත ලැබෙන්නට සැලැස්විය යුතුය.

*දැනටමත් අයදුම්පත් යොමු කර ඇති නිලධාරීන් නැවත අයදුම්පත් යොමු කිරීම අවශ්‍ය නොවේ.

2019.01.11 දිනැතිව නිකුත් කරන ලද අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් අනෙකුත් කරුණු එලෙසම බලපැවැත්වේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ලේකම්,
කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන,
වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය.

දිනය :-